# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,630—1958 දෙසැම්බර් 29 වැනි සඳුද—29.12.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 557**

අ.ආ.කා. අංකය: C. 162/49 (II).

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඕ.බී.ඊ. නාමධාරී කේ. අල්වාපිල්ලේ මහතා දිවයිනට පෙරලා පැමිණෙන තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජසභා නියෝගවල 51 (1) වැනි වගන්තිය යටතේ, සිවිල් නිලධාරී බී. මහාදේව මහතා වෙනුවට, ආහාර කොමසාරිස්, සිවිල් නිලධාරී කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා, 1958 වේ දෙසැම්බර මස 23 වැනි දින සිට කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරෙහි ස්වකීය රාජකාරිවලට අතිරේකව, වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පත්කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 දෙසැම්බර 24 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : O. 339/50.

ලංකාවෙහි, ඉතාලි අතිවිශේෂ හා පූර්ණ බල ඇමති ලෙස බලය පවරනු ලැබූ, ආචාර්ය පෙඹලෝ ද මිචලිස් ඩි ස්ලොංහෙලෝ උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 දෙසැම්බර් 23 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය, කොළඹ.

---

1947 සැප්තැම්බර් මස 24 දින සහ අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයෙන් (ශීර්ෂ 304) වෙනස් කරන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආඥපනතේ 4 වන ඡෙදය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමතිතුමා විසින් පිහිටුවන ලද මධ්‍යම කෘෂිකර්ම මණ්ඩලය පහත නම් සඳහන් අයගෙන් නියුක්ත වන බව දැනුම් දෙනු ලැබේ :—

1. කෘෂිකර්ම අධ්‍යක්ෂක (සභාපති)
2. ඉඩම් කොමසාරිස්,
3. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක,
4. කැලෑ සංරක්ෂක,
5. වාරිමාර්ග අධ්‍යක්ෂක,
6. සමුපකාර සංවර්ධන කොමසාරිස්,
7. තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක,
8. රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක,
9. පොල් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක,
10. වෙළඳ සංවර්ධන අධ්‍යක්ෂක,
11. ගොවිජනසේවා කොමසාරිස්,
12. කිරි මණ්ඩලයේ සභාපති,
13. ආහාර පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක,
14. වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක,

3967—ජේ. ඇන්. ආර් 27468—4,461 (12/58)

**පාලන දිස්ත්‍රික්කවල නියෝජිතයෝ**

පාලන දිස්ත්‍රික්කවල නියෝජිතයන්ගේ නම් කලින් කලට ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබේ

15. යාපනය
16. මන්නාරම
17. වවුනියාව
18. ත්‍රිකුණාමලය
19. පුත්තලම
20. අනුරාධපුරය
21. පොළොන්නරුව
22. කුරුණෑගල
23. මාතලේ
24. මහනුවර
25. කෑගල්ල
26. නුවරඑළිය
27. බදුල්ල
28. බදුල්ල
29. රත්නපුරය
30. කළුතර
31. ගාල්ල
32. මාතර
33. හම්බන්තොට
34. මඩකලපුව
35. කොළඹ

**නම් කරන ලද සාමාජිකයෝ**

36. ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ සභාපති.
37. පහත රට නිෂ්පාදන සංගමයේ සභාපති.
38. ලංකා විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම අංශයේ ප්‍රධාන තැන.
39. මේජර් ඊ. සී. ද පොන්සේකා මහතා.
40. ආර්. එච්. ද මැල් මහතා.
41. එස්. පද්මනාදන් මහතා.
42. රේ විජේවර්ධන මහතා.
43. සර් ජේම්ස් පී. ඔබේසේකර මහතා.
44. සිරිල් මුතුකුමාරු මහතා (හපුතලේ)
45. ආරියදස ජයවර්ධන මහතා.
46. එම්. එම්. කුමාරකුලසිංහම් මහතා.

**ලේකම්**

47. කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන)

කේ. එම්. ඩී. ජයනෙත්ති,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම්.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය,
යූනියන් පෙදෙස,
කොළඹ 2, 1958 දෙසැම්බර් මස 24 වැනිද.

---

# මිල පාලන දැන්වීම්

**නො. 55 දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ උප ආහාර මිළ පාලක තැන්පත් පරරාජසේකරම් පිල්ලේ තම්බයියා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පවරා තිබෙන බලතල අනුව මේ නියෝගයෙන්—

1. 1958 ජූනි 25 වෙනි දින අංක 11,378 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජූනි 20 වෙනි දින වී. 47 දරණ. ආහාර මිළ නියෝගයේ සඳහන් පරිදි කරවල සඳහා තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

2. මීට යාකර ඇති උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩර යක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මීට යාකර ඇති උප ලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ උප ලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

   (අ) කරවල හෝ වියළි ඉස්සන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ කරවල හෝ වියළි ඉස්සන් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

   (ආ) කරවල හෝ වියළි ඉස්සන් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

   (ඇ) '' සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' සියලුම සිල්ලර වශයෙන් විකිණීම සඳහා බලපවත්වන බවත් ;

   (ඈ) '' වේලන ලද මාළු '' සහ '' කරවල '' එක සේ සලකන බවත් ;

4. මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් ;

5. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනුලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කරවල හෝ වියළි ඉස්සන් තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා 1 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම හා පළමුවෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

   (අ) විකුණූ දිනය ;
   (ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;
   (ඇ) විකුණූ ප්‍රමාණය දළ බර සහ ශුද්ධ බර ;
   (ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
   (ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

8. පළමුවන උපලේඛනවල 2 සහ 3 වෙනි උපලේඛනයන්හි සඳහන් කරවල සහ වියළි ඉස්සන් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් ඇතුළත් විය යුතු බවද නියම කරමි.

9. තවද කුම්බලා, බොම්බිලි, හාල්මැස්සන් සහ වියළි ඉස්සන් හැර උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් වෙනත් කරවල කිසිවක බහා විකුණන විට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් දහය බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

10. උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් කුම්බලාවුන් කිසිවක බහා විකුණන විට, එහි බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විසිපහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

11. උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් අට බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

12. උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් හාල්මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක "හා භාණ්ඩය සඳහා දළ බරින් තාරබර ලෙස අඩුම වශයෙන් රාත්තල් විස්ස බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

13. උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් වියළි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් පහලොව බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

14. මෙම නියෝගය සඳහා '' ශුද්ධ '' යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාරබර අඩුකොට ඉතිරිවන බර හෝ කරවල නැතහොත් වියළි ඉස්සන්ගේ පමණක් බර බවද නියම කරමි.

1958 දෙසැම්බර් මස 19 දින පෙ. ව. 10 ට වවුනියා කච්චේරියේදී අත්සන් කරන ලදී.

පී. තම්බයියා,
වවුනියා දිස්ත්‍රික්කයේ උප ආහාර පාලක තැන.

## පළමුවෙනි උප ලේඛනය

| අංකය | පළමුවෙනි තීරය<br>විස්තරය | වවුනියා දකුණ දෙමළ කොට්ඨාශය, ආසිකුලම්, වවුනියා, නොච්චිමෝදෙයි, නෙදුම්කුලම් සහ පුදුකුලම්. වවුනියා දකුණ සිංහල කොට්ඨාශය, මඩුකන්ද, සහ ඊරට්ටෙරිය කුලම<br>දෙවෙනි තීරය<br>තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. | <br>තුන්වෙනි තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | හිස රහිත තෝර ... ... ... | 118 0 | 1 30 |
| 2. | හිස සහිත තෝර ... ... ... | 99 52 | 1 0 |
| 3. | හිස රහිත කට්ටා ... ... ... | 86 80 | 0 85 |
| 4. | කට්ටා සම්පූර්ණයෙන් ... ... ... | 65 60 | 0 75 |
| 5. | හිස සහිත අන්ජිලා ... ... ... | 59 24 | 0 70 |
| 6. | හිස රහිත අන්ජිලා ... ... ... | 63 48 | 0 80 |
| 7. | හිස රහිත පරව් ... ... ... | 97 40 | 1 10 |
| 8. | හිස සහිත පරව් ... ... ... | 78 32 | 0 75 |
| 9. | හිස රහිත කොඩුවා ... ... ... | 86 80 | 0 90 |
| 10. | හිස සහිත කොඩුවා ... ... ... | 61 36 | 0 62 |
| 11. | බලයා ... ... ... ... | 86 80 | 0 90 |
| 12. | තොන්ඩා ... ... ... ... | 65 65 | 0 75 |
| 13. | කුම්බලා ... ... ... ... | 25 86 | 0 35 |
| 14. | බොම්බිලි ... ... ... ... | 78 32 | 0 95 |
| 15. | හාල් මැස්සෝ ... ... ... | 74 08 | 0 90 |
| 16. | ලෙලි රහිත වියළි ඉස්සෝ ... ... ... | 118 60 | 1 15 |
| 17. | ලෙලි සහිත වියළි ඉස්සෝ ... ... ... | 93 16 | 0 90 |

## දෙවෙනි උප ලේඛනය

| අංකය | 1 වෙනි තීරය<br>කොට්ඨාශය | දෙවෙනි තීරය<br>1 වෙනි උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් ගණන් වලට පහත මිළ ගණන්ද එකතු විය යුතුයි<br>රු. ශ. | තුන්වෙනි තීරය<br>1 වෙනි උප ලේඛනයේ 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන්වලට පහත මිළ ගණන්ද එකතු විය යුතුයි<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | වවුනියා දකුණ දෙමළ ආදයම් පාළක කොට්ඨාශයේ මරුදන්කුලම්, මරදමඩු, රාසේද්‍ර කුලම්, වවුනියා දකුණ සිංහල ආදයම් පාලක කොට්ඨාශයේ මරදමඩුව හැර සුදුවැන්ද පුලවු, උළුකුලම ... ... ... ... | 0 25 | 0 01 |
| 2. | වවුනියා දකුණ දෙමළ ආදයම් පාලක කොට්ඨාශයේ පෙරියපුලියන්කුලම්, වාකයිකඩ්ඩි නාඹළුකුලම්, වාලෙයිවෙතාල්කුලම් සහ සිංහල ආදයම් පාලක කොට්ඨාශයේ උළුක් කුලම කොට්ඨාශයේ මරදමඩුව ... ... ... | 0 50 | 0 01 |
| 3. | වවුනියා උතුර ආදයම් පාලක කොට්ඨාශයේ නෙඩුන්කර්නි, මාන්කුලම්, ඔලුමඩු, කනගරායන්කුලම් සහ පුලියන්කුලම් ... ... ... | 0 50 | 0 01 |
| 4. | වවුනියා උතුරු ආදයම් පාලක කොට්ඨාශයේ පරතන්, මානවාලන්පඩ්ඩිපුරිප්පු, තන්ඩු වාන්, කච්චිලාමඩු, උංචල්කොඩ්ඩු ... ... ... | 0 75 | 0 02 |
| 5. | මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක දිස්ත්‍රික්කයේ මුල්ලියවාලෙයි, තන්නියුත්තු, මුලතිවු, වල්ලාමුල්ලිවයිකාල් ... ... ... ... | 1 00 | 0 02 |
| 6. | මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක කොට්ඨාශයේ කුමුලමුනෙයි, පුදුකුඩියිරිප්පු, අම්පල වන්පොක්කනෙයි ... ... ... ... | 1 25 | 0 02 |
| 7. | මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක කොට්ඨාශයේ කෝකිලායි සහ කොක්කුතොඩුවායි ... | 1 50 | 0 03 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**ටී/16/58 දරණ ආහාර මිළ නියෝගය.** **කරවල සහ වියළි ඉස්සෝ.**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

ආහාර නියෝජ්‍ය මිළ පාලක තැන්පත් ඇන්ටන් රොත්වෙල් මැකේයිසර් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් ආහාර නියෝජ්‍ය මිළ පාලක කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

1. අංක 11,405 සහ 1958 ජූලි 1 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අංක ටී/8/58 සහ 1958 ජූනි 27 වැනි දින දරන ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

2. මීට යාකර ඇති පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වර්ගවලට අයත් කරවල සහ වියළි ඉස්සන් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් හා සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ පළමු වැනි උප ලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. මීට යාකර ඇති පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දෙවැනි උප ලේඛනයේ පළමු වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන්හි සිල්ලර වශයෙන් විකිණීමේදී, විකිණිය හැකි වැඩිම මිළ රාත්තලක් ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුළ විකිණීම සඳහා යොද ඇති පළමු වැනි උප ලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් 2 වැනි උප ලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මිළ සමග වැඩි කිරීමෙන් බවද—

4. මෙම නියෝගය සඳහා—

(අ) '' තොග වෙළඳාම '' යනුවෙන් අදහස් කරනුයේ පළමුවැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය එකම අවස්ථාවකදී දළ බර හොණ්ඩරයක් හෝ වැඩි ගණනක් විකිණීම හෝ යළිත් විකිණීමය ;

(ආ) පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දළ බර හොණ්ඩරයකට අඩු ගණනක් පාරිභෝගය සඳහා මිළයට ගන්නන්ගේ පාවිච්චිය සඳහා විකිණීම සිල්ලර වෙළඳාම වේ ;

(ඇ) කරවල හෝ වියලි ඉස්සන් තොග වශයෙන් විකිණීමට පුරුදුව සිටින කවරෙකු හෝ තොග වෙළෙන්දකු ලෙස සලකන බවත් ;

(ඈ) '' තොග වෙළෙන්දකු තොග වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' තොග වෙළෙන්දකු සිල්ලර වෙළෙන්දකුට තොග වශයෙන් විකිණීමේදී බල පවත්වන බවත් ;

(ඉ) '' සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' සියලුම සිල්ලර වශයෙන් විකිණීම් සඳහා බලපවත්වන බවත් ;

(ඊ) '' වේලන ලද මාළු '' සහ '' කරවල '' එකසේ සලකන බවයි.

5. මෙම නියෝගයෙන් වැඩිම මිළ පාලනය වන සෑම ප්‍රදේශයකම පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙනම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු නොවිකිණිය යුතු බව නියම කරමි.

6. මෙම නියෝගයෙන් වැඩිම මිළ පාලනය වන සෑම ප්‍රදෙශයකම පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එකී ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සඳහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

7. එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

8. තවද මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කරවල සහ වියලි ඉස්සන් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකුම හා පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුව හොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;

(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

9. පළමු වැනි උප ලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් කරවල සහ වියලි ඉස්සන් විකුණන විට, ඒ විකුණන ලබන ද්‍රව්‍ය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් පළමු වැනි උප ලේඛනයෙහි දෙවැනි තුන් වැනි සහ හතර වැනි තීරවල සඳහන් මිළ ගණන්වල හා දෙවැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් වල ඇතුළත් වන බවද නියම කරමි.

10. තවද කුම්බලා, බොම්බිලි, හාල්මැස්සන් සහ වියලි ඉස්සන් හැර උප ලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් වෙනත් කරවල කිසිවක බහා විකුණන විට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් 10 බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

11. උප ලේඛනවල 1 වැනි තීරයෙහි සඳහන් කුම්බලාවුන් කිසිවක බහා විකුණන විට, ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් 25 බැගින් අඩු කොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

12. උප ලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් 8 බැගින් අඩු කොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

13. උප ලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් හාල් මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දළ බරින් තාරබර ලෙස අඩුම වශයෙන් රාත්තල් 20 බැගින් අඩු කොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

14. උප ලේඛනයේ පළමු වැනි තීරයේ සඳහන් වියලි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දළ බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් 15 බැගින් අඩු කොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

15. මෙම නියෝගය සඳහා '' ශුද්ධ '' යන්නෙන් හැඟ වෙන්නේ දළ බරින් තාර බර අඩු කොට ඉතිරි වන බර හෝ කරවල නැතහොත් වියලි ඉස්සන්ගේ පමණක් බර බවද නියම් කරමි.

1958 දෙසැම්බර් 20 වෙනි දින පෙ. ව. 10 ට ත්‍රිකුණාමල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඇන්ටන් ආර්. මැකේයිසර්,
ත්‍රිකුණාමලයේ ආහාර නියෝජ්‍ය මිළ පාලක.

## පළමුවැනි උප ලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | ත්‍රිකුණාමල නගරයේ සහ කඩවත් කරවන ආදයම් නිළධාරි තැනගේ කොට්ඨාශය තුළ | ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සභා කොට්ඨාශය තුළ ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ | කොඩ්ඩියාර් පත්තුව හ තම්පලගමුව පත්තුව කර වන නිලධාරින්ගේ කොට්ඨාශය තුළ දළ බර හොණ්ඩරයක වැඩිම තොග මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| හිස රහිත තෝර | 116 60 | 1 24 | 118 00 |
| හිස සහිත තෝර | 98 06 | 1 24 | 99 46 |
| හිස රහිත කට්වා | 85 17 | 0 89 | 87 10 |
| හිස සහිත කට්වා | 65 10 | 0 89 | 66 50 |
| හිස රහිත අන්ජීලා | 63 04 | 0 72 | 64 44 |
| හිස සහිත අන්ජීලා | 58 92 | 0 72 | 60 32 |
| හිස රහිත පරවා | 96 00 | 1 03 | 97 40 |
| හිස සහිත පරවා | 77 46 | 1 03 | 78 86 |
| හිස රහිත කොඩුවා | 85 70 | 0 87 | 87 10 |
| හිස සහිත කොඩුවා | 60 98 | 0 87 | 62 38 |
| බලයා | 85 70 | 0 98 | 87 10 |
| කොන්ඩ | 65 15 | 0 72 | 66 55 |
| කුම්බලා | 26 46 | 0 32 | 27 86 |
| බොම්බිලි | 77 46 | 0 92 | 78 86 |
| හාල් මැස්සෝ | 73 34 | 0 87 | 74 74 |
| ලෙලි රහිත වියලි ඉස්සෝ | 116 60 | 1 12 | 118 00 |
| ලෙලි සහිත වියලි ඉස්සෝ | 91 88 | 0 87 | 93 28 |

## දෙවැනි උප ලේඛනය

| 1 වැනි තීරය<br>ගම්මුලාදෑනි කොට්ඨාශය | 2 වැනි තීරය<br>පළමුවැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සහා ප්‍රදේශයේ විකුණන මිළ වැඩි කළ හැකි මිළ<br>රු. ශ. |
| --- | --- |
| උප්පවලිය සහ සාම්පුල්තීව් | — |
| ඊනවරාය, වෙල්ලනහල්, තම්පලගමුව සහ නිලාවලිය | 0 01 |
| සින්නකින්නියාව, පෙරියකින්නියාව, කුරුන්වාකර්නි, උප්පාර්, කන්තලාව, මූතූර්, අක්කරෙයිවෙනෙයි, සම්පූරි, වල්ලිකෙයි තීව්, කිළිවෙට්ටි, තෝප්පූර්, පල්ලිකුඩිරිප්පු සහ කුම්බුරුපිටිය | 0 02 |
| කුනිතීව්, ඊච්චලම්පට්ටෙයි, කූච්චවලිය, පැනිකෙටියාව සහ ගෝමරන්කඩවල | 0 03 |
| තිරියායි, මැදවච්චිය සහ ගල්කඩවල | 0 04 |
| පුල්මුට්ටෙයි | 0 05 |
| තෙන්නමරවාඩිය සහ පරන මැදවච්චිය | 0 06 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළයි. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී